[ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා]

ෂම්මී සිල්වා මහත්තයා ගැන කථා කළොත්, ක්‍රිකට් වෙනුවෙන් යම්කිසි වැඩ කොටසක් එතුමාත් කර තිබෙනවා. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. හැම කෙනාම ක්‍රිකට් වෙනුවෙන් ඒ විධියට වැඩ කරලා තිබෙනවා. හැබැයි, පාර්ලිමේන්තුව හැටියට අපේ වගකීම වෙන්න ඕනෑ, ක්‍රීඩා පනත වෙනස් කිරීමයි. ක්‍රීඩා පනත වෙනස් කරන්න අතුරු කමිටු දමන්න එපා. ක්‍රීඩා පනත වෙනස් කර පොදුවේ හැම ක්‍රීඩාවකටම අවස්ථාව ලබා දෙන්න. එහෙම නැත්නම් රගර්වලට වෙච්ච දේ ඒවාටත් සිද්ධ වෙයි. අද 15-a-side රගර් කණ්ඩායමක් පිටරටකට යවන්න බැහැ, ෆුට්බෝල් කණ්ඩායමක් යවන්න බැහැ. ක්‍රීඩා බොහොමයකටම මේ තත්ත්වය උදා වෙලා තිබෙනවා. අන්තිමට ක්‍රිකට්වලටත් ඒ තත්ත්වය වෙන්න දෙන්න එපා. ගරු ඇමතිතුමනි, ඒ නිසා සමස්ත ක්‍රීඩා පනතම ඔබතුමාගේ කාලය තුළ වෙනස් කරන්න කියන ඉල්ලීම කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අනුර දිසානායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.08]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ විගණන විමසුම පිළිබඳව කෙරෙන විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අරුන්දික ප්‍රනාන්දු රාජ්‍ය අමාත්‍යවරයා කථා කරනකොට කිව්වා, ජයන්ත ධර්මදාස වෙනුවට උපාලි ධර්මදාස ගේන්නද, ෂම්මී සිල්වා වෙනුවට වෙන කවුරුවත් ගේන්නද හදන්නේ කියලා. ඒක නොවෙයි මෙතැන ප්‍රශ්නය. අපි කවුරුත් දන්නවා, අපි විශාල ජයග්‍රහණ නැති රටක් බව. හැබැයි, ජාත්‍යන්තර වශයෙන් සතුටු විය හැකි ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් අපට අරගෙන දුන්නේ ක්‍රිකට් ක්‍රීඩාවෙන්. ඒ නිසා අපේ තරුණ පරම්පරාවත්, පොදු ජනතාවත් එක්ක ඉතාම සමීප, සංස්කෘතිකමය සබඳතාවක් ක්‍රිකට් ක්‍රීඩාව සමඟ තිබෙනවා. හැබැයි, පසුගිය කාලයේ අපේ ක්‍රිකට් ක්‍රීඩාවට අත් වූ ඉරණම පිළිබඳව කවුරුවත් සතුටු වෙන්නේ නැහැ. අපට වසර ගණනාවකට පසුව World Cup Qualifier තරගවලට යන්න සිද්ධ වුණා. ඒක හොඳ තත්ත්වයක්ද? ඒක හොඳ තත්ත්වයක් නොවෙයි. අපට වඩා පහළින් සිටි රටවලට අපි පරාජය වුණා. සමහර තරගවලදී අපි පරාජයට පත් වෙච්ච ආකාරය බැලුවොත්, ඒවා අපට අනුමත කරන්න බැහැ. මෑතකදී තිබුණු ටෙස්ට් තරඟාවලිය බැලුවොත්, එය කිසිසේත්ම අපට අනුමත කරන්න පුළුවන් තත්ත්වයක් නොවෙයි. එම නිසා අපට පෙනෙනවා, අද ක්‍රිකට් ක්‍රීඩාව වැටිලා තිබෙන බව. ඒක අපි කවුරුත් පිළිගන්නවා.

ක්‍රීඩකයන්ගේ විනය පිළිබඳවත් අද බරපතළ චෝදනා එල්ල වෙනවා. ඒ, තරුණ ජවය තිබෙන කණ්ඩායමක්. ඔවුන්ට ජීවිතය පිළිබඳ විශාල වශයෙන් අත්දැකීම් නොතිබෙන්න පුළුවන්. ඒ නිසා ඔවුන්ගේ කොලුකමෙන් යම් යම් දේවල් සිදු විය හැකියි. හැබැයි, ඒවා පාලනය කරන්න ඕනෑ කවුද? ඒ විනය, ඒ ආදර්ශය, ඒ මෙහෙයවීම දෙන්න ඕනෑ පාලක මණ්ඩලය විසින්. පාලක මණ්ඩලයේ හැසිරීම මෙවැනි හැසිරීමක් නම්, එය කරන්නේ කොහොමද? මම කියන්නේ මෙයයි. ඔවුන්ගේ වයසට හෝ ඔවුන්ගේ තරාතිරමවලට අනුව මුහුකුරා යද්දී අපි යම් විනයක් අපේක්ෂා කරනවා නේ. විශේෂයෙන් ඔවුන් හොබවන වගකීම අනුව යම් විනයක් අපි අපේක්ෂා කරනවා නේ. හැබැයි තමන්ගේ වගකීමට, තමන්ගේ මුහුකුරා යාමට කිසිසේත්ම නොගැළපෙන හැසිරීමක් නම් පාලක මණ්ඩලය පෙන්නුම් කරන්නේ, ඔවුන් විසින් හසුරුවන දරුවන්ට කුමක් වෙයිද? ඒ නිසා අද ක්‍රිකට් ක්‍රීඩාවට අත් වී තිබෙන ඉරණමට සැලකිය යුතු ප්‍රමාණයෙන් වර්තමාන පාලක මණ්ඩලය වග කියන්න ඕනෑ. ඔවුන්ට ඒකෙන් ගැලවෙන්න බැහැ. ඒකෙන් ඔවුන්ට ගැලවෙන්න පුළුවන්ද?

ඒ විතරක්ද? ඊළඟට මේ එල්ල වී තිබෙන මූල්‍ය චෝදනා මොනවාද බලන්න. මේ විගණන විමසුම ගත්තොත්, මේක පොඩි විගණන විමසුමක්. මෙහි තිබෙන්නේ මොකක්ද? T20 කුසලානය සඳහා ඕස්ට්‍රේලියානු සංචාරය පිළිබඳ විගණනයයි මේකේ තිබෙන්නේ. එහෙම නැතුව, සමස්ත පාලක මණ්ඩලයේම විගණනය නොවෙයි. එක් සංචාරයක විගණනය මෙහෙම නම්, සමස්ත ආයතනයේම ක්‍රියාකාරිත්ව විගණනය කොහොම වේවිද? ඒ වාගේම මෙම විගණනයෙන් පෙන්නුම් කරන කරුණු මොනවාද? ඒ විගණන විමසුමේ තිබෙන පරිදි, සභාපතිවරයා මිලියන 11ක් වැය කරනවා නම්, ඒ වාගේම ලේකම්වරයා මිලියන 5.4ක් වැය කරනවා නම්, ඒ වාගේම උප සභාපතිවරයා මිලියන 5.4ක් වැය කරනවා නම්, අනික් උප සභාපතිවරයා මිලියන 4.7ක් වැය කරනවා නම්, මොකක්ද තත්ත්වය? මේ වැය කිරීමේ ආකෘතිය දිහා බලන්න. ඒවා භාණ්ඩ මිලදී ගැනීමකදී හෝ පාරක් ඉදිකිරීමකදී හෝ කරපු ඒවා වාගේ නොවෙයි, නාස්තිකාර වියදම්. ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මුදල් තමන්ගේ පෞද්ගලික, කෑම, මජර සුඛවිහරණය වෙනුවෙන් තමයි වැය කරලා තිබෙන්නේ. මේ හෝටල් වියදම් දිහා බලන්න. මා දන්නේ නැහැ, කාන්තාවන්ට වියදම් කළාද, නැද්ද කියලා. හැබැයි, ඒවායෙන් පෙන්නුම් කරන්නේ මොකක්ද? මේ පාලක මණ්ඩලයට ඉතාම විනයක් සහිත ක්‍රිකට් කණ්ඩායමක් පවත්වාගෙන යන්න පුළුවන්ද? මෙහිදී මිලියන 60කට වැඩි මුදල් ප්‍රමාණයක් වැය කර තිබෙනවා. හැබැයි, ඔවුන් ඒ මුදල් වැය කරපු ක්ෂේත්‍ර දිහා බලන්න. ඔවුන් මේ මුදල් වැය කරලා තිබෙන්නේ කුමකටද? බැට් එකක් මිලදී ගන්නකොට එය හොරකමක් නොවෙයි, බෝලයක් මිලදී ගන්නකොට එය හොරකමක් නොවෙයි. නමුත් තමන්ගේ කෑම, මජර ජීවිතය පෝෂණය කර ගැනීම සඳහා, විවිධාකාරයෙන් පෝෂණය කර ගැනීම සඳහා තමයි මේ මුදල් වැය කරලා තිබෙන්නේ. මෙවැනි පිරිසකට පුළුවන්ද තරුණ කණ්ඩායමකට නායකත්වය දෙන්න? මේ පිරිස මෙහෙම නම්, එය කරන්න බැහැ.

ඒ විතරක් නොවෙයි, අනතුරුව ඔවුන් ඇවිල්ලා කියන්නේ මොකක්ද? ඔවුන් කියනවා, මේ Sri Lanka Cricket ආණ්ඩුවට අයිති නැහැ කියලා. ආණ්ඩුවට අයිති නැහැ ලු, මේක. මේක ශ්‍රී ලංකාවේ ක්‍රිකට්. මම මේක කලිනුත් කිව්වා, ඕනෑ නම් ජයන්ත ධර්මදාසටත්, ෂම්මී සිල්වාටත් "Jayantha and Shammi Cricket Club" කියලා club එකක් දමා ගන්න කියන්න. මේක Sri Lanka Cricket. ICC එක විසින් ක්‍රිකට් ආයතනවලට ස්වාධීනත්වය දුන්නේ ඇයි? ස්වාධීනත්වය දෙනකොට ඔවුන් අපේක්ෂා කළා, ආණ්ඩු විසින් අනිසි ලෙස කරන මැදිහත්වීම් ක්‍රිකට් ක්‍රීඩාවට බාධා වෙයි කියලා. ඒකට විතරයි ස්වාධීනත්වය දුන්නේ. මේක Sri Lanka Cricket. Tournaments ලැබෙන්නේ ලංකාවට. එහෙම නැතුව ෂම්මීගේ හෝ ජයන්තගේ ක්‍රිකට්වලට නොවෙයි. මේක ගජ මිතුරන්ගේ සමාගමක් නොවෙයි, ශ්‍රී ලංකාවේ සමාගමක්. මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනතකින් ඔවුන්ට ස්වාධීනත්වය ලබා දීලා තිබෙනවා. එච්චරයි. හැබැයි, ඔවුන් මාධ්‍ය සාකච්ඡා තියන කොට අඩුම තරමින් ඔවුන් කවුද කියලාවත් දන්නවාද? දන්නේ නැහැ. හිස උදුම්මා ගත්, උද්ධච්ච, කිසි කෙනෙකුට ඇහුම්කන් දෙන්නේ නැති කට්ටියක්, මේ අය. මට

මතකයි, එක පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් ඔවුන් ගැන කිව්වාම, "ආ ඒ මන්ත්‍රී කවුද, මොකක්ද දන්නේ නැහැ, ඔහුගේ හැසිරීම්" වාගේ දේවල් කියනවා. ඔබතුමන්ලා ඒක දකින්න ඇති. එහෙම උද්ධච්ච කණ්ඩායමක්, මේ කණ්ඩායම. ඒ නිසා ක්‍රිකට් ක්‍රීඩාව අද මේ තත්ත්වයට පත් වීම ගැන වර්තමාන පාලක මණ්ඩලයේ මේ උද්ධච්ච විනාශකාරී හැසිරීම වග කියන්න ඕනෑ. නමුත් ICC එක අර කියපු ස්වාධීනත්වය තුළින් අපේක්ෂා කළේ මේ වාගේ දේවල් නොවෙන්නයි. හැබැයි, ඒවා වෙනවා නම්, ජාත්‍යන්තර ක්‍රිකට් සම්මේලනයට - ICC - එකට ගිහිල්ලා අපි කියන්න ඕනෑ, "ඔබතුමන්ලා මේ වගන්තියෙන් අපේක්ෂා කළේ මේක. හැබැයි, මෙය මේ ආකාරයෙන් සිදුවී නැහැ, ඒකට හාත්පසින්ම වෙනස් දෙයක් සිදුවී තිබෙන්නේ" කියලා. ඒ නිසා මේක නිසි පරිදි මෙහෙයවීම සඳහා අවශ්‍ය වන නීති සම්පාදනය කිරීම සඳහා අපි අවස්ථාව ගන්න ඕනෑ. දකුණු අප්‍රිකාවේත් මේ ප්‍රශ්නයම ආවා. ඔවුන් මොකක්ද කළේ? ව්‍යවස්ථාව වෙනස් කළා. වෙනස් කිරීම පිළිබඳව ඒ රටේ ක්‍රීඩා අමාත්‍යවරයා ICC එකට දැනුම් දුන්නා. එවිවරයි කළේ.

අපේ ක්‍රිකට් ක්‍රීඩාව කාලාන්තරයක් තිස්සේ gang එකක් අතේ තියෙන්නේ. ඡන්දවලින් ස්වාධීන මිනිස්සු පත් වෙන්නේ නැහැ. ඔබ හිතනවාද, මේ ඡන්දවලින් ස්වාධීනව තරග වැදිලා කාට හරි එන්න පුළුවන් කියලා? කාටවත් එන්න බැහැ. ඒ නිසා තමයි අපේ රටේ ප්‍රධාන පෙළේ ක්‍රීඩකයෙක් වූ මුරලිදරන් කිව්වේ, "මට ජනතාවගෙන් ඡන්දය ඉල්ලලා මන්ත්‍රීවරයෙක් වෙන්න පුළුවන්, හැබැයි, මට කවදාවත් Sri Lanka Cricket එකට නම් ඡන්දය ඉල්ලලා එන්න බැහැ" කියලා. ඇයි එහෙම කිව්වේ? මේකේ කල්ලි කිහිපයක් තිබෙනවා. සාමාන්‍යයෙන් පොදුවේ ජනතාව විශ්වාස කරනවා, එක් එක් ස්වාධීන පුද්ගලයන් තමන්ගේ හැකියාව, තමන්ගේ ආදර්ශයන්, වුවමනාව මත clubsවලින් ඡන්ද දීලා Board එකට එයි කියලා. එහෙම වෙන්නේ නැහැ. මේක gang එකක්; මේක මාෆියා gang එකක්. අද ඊයේ ඉඳන් නොවෙයි, කාලයක් තිස්සේ ඉඳන්. මාෆියා gangs කිහිපයක් තිබෙනවා. ඔය කියන්නේ තිලංගගේ කල්ලිය, ජයන්තගේ කල්ලිය, ෂම්මිගේ කල්ලිය, උපාලිගේ කල්ලිය කියලා. මේ විධියේ gang ටිකක් නේ මේක අස්සේ තිබෙන්නේ. ගරු ඇමතිතුමා, තමුන්නාන්සේ හෙට නිලවරණයක් පැවැත්වුවත්, මේ දූෂිත මාෆියා gangsවලින් එකක් තමයි මේකේ බලය ගන්නේ. ඇයි? මේකේ අධික මුදල් සම්භාරයක් සැරිසරනවා. තමන්ට ඕනෑ පරිදි ඒ මුදල් වියදම් කිරීමේ බලයක් ලබා දීලා තිබෙනවා.

ඒ අය සතුටු කිරීම සඳහා ඇති තරම් මුදල් පොම්ප කරන්න ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා ඒ gang එකෙන් මේක බේරාගන්න ඕනෑ. එහෙම නොවෙයිද? ඒ සඳහා මොකක්ද කරන්න ඕනෑ? මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා, ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු චිත්‍රසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීම ගැන. එතුමන්ලාගේ යෝජනාව මොකක්ද? කොහොමද, අපි ස්වාධීන සාමාජිකයන් මේක ඇතුළට ගෙනෙන්නේ? දැන් ඉන්න කිසි කෙනෙක් ස්වාධීන නැහැ. ඔවුන් එකට සාකච්ඡා කරලා, එකට කුමන්ත්‍රණ කරලා, එකට හොරකම් කරන, එකට එකතු වෙලා සිටින මාෆියා කණ්ඩායමක්. දැන් අප හමුවේ තිබෙනවා, මේ මාෆියා කණ්ඩායමට තවත් අපි ක්‍රිකට් ක්‍රීඩාව යටත් වෙන්න දෙනවාද, එහෙම නැත්නම් මේ මාෆියා කණ්ඩායම බිඳිනවාද කියන ප්‍රශ්නය. ඒක බිඳින්න ඡන්ද තියලා හරියන්නේ නැහැ. හෙට ඡන්දයක් තියන්න. ඔය gang එකකින් එක් කෙනෙක්, දෙන්නෙක් තමයි ආපසු බලයට එන්නේ. එහෙම නම්, ක්‍රිකට් ආයතනය සඳහා මේ ගැන්සි පත් වෙන එක වැළැක්වීම සඳහා අනිවාර්යයෙන්ම අපි නීති සම්පාදනය කරන්න ඕනෑ. ඒ සඳහා නව ක්‍රමවේදයක් අවශ්‍යයි. ඒ නිසා තමයි හිටපු විනිසුරු චිත්‍රසිරි මැතිතුමා විසින් යෝජනා ඉදිරිපත් කර තිබෙන්නේ. කොහොමද අපි ස්වාධීන කණ්ඩායමක් මේකට ගෙනෙන්නේ? මොකද, ඡන්දයෙන් තවදුරටත් පත් වෙන්නේ ස්වාධීන කණ්ඩායම් නොව කල්ලි, මාෆියා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් තර්ජනය කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාටත් තර්ජනය කරන, ඔබතුමාවත් පිළිගන්නේ නැති, කිසි කෙනෙකුගේ අණසකට යටත් වෙන්නේ නැති කල්ලියක් හදාගෙන ක්‍රිකට් ක්‍රීඩාවත්, ලංකාවේ කීර්තියත්, ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ කීර්තියත් නැති කරන ආයතනයක් ගොඩනහලා තිබෙනවා. ඒ නිසා අපි පාර්ලිමේන්තුවේ නීති සම්පාදනය කරන්න ඕනෑකම තිබෙනවා. මේ ගැන්සියෙන් - කල්ලියෙන් - ක්‍රිකට් ක්‍රීඩාව ගලවාගන්න ඕනෑකම තිබෙනවා. අනික් ඒවායේත් එහෙම තමයි. හැබැයි, ඒවා එතරම් උඩට එන්නේ නැත්තේ මේ තරම් මුදල් ප්‍රමාණයක් ඒවායේ සැරිසරන්නේ නැති නිසායි. නැත්නම් ඒවාත් එහෙමයි. ඒ නිසා අපි නැවත කල්පනා කරන්න ඕනෑ මෙම ආයතනය සඳහා ස්වාධීන සභිකයන් පත් කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව. ඒකට අපි යමු. අපේ රටේ තිබෙනවා ස්වාධීනව කටයුතු කරන ආයතන. Bar Association එක තිබෙනවා. Bar Association එකෙන් එක්කෙනෙක් nominate කරන්න පුළුවන්. තව අවශ්‍ය නම්, ගණකාධිකාරිවරුන්ගේ - Chartered Accountantsලාගේ - පිළිගත් ආයතනය තිබෙනවා. ඒකෙන් ගණකාධිකාරිවරයෙක් නම් කරන්න කියලා කියනවා. මෙවැනි තෝරාගන්නා ලද නිල ආයතනවලින් සාමාජිකයන් හැටියට ගෙනෙන්න ඕනෑ, මේක ස්වාධීන වෙන්න. ඡන්දයෙන් හතර පස්දෙනෙකුත් ගෙනෙන්න. ගෙනැල්ලා මෙන්න මේ ගැන්සිය - කල්ලිය- ඉවත් කරන්න ඕනෑ.

1996න් පස්සේ අවුරුදු 25ක්, 26ක් තිස්සේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තිබෙන්නේ කල්ලි අතේ. මොන ඇමතිවරයා ආවත්, එක්කෝ ඇමතිවරයා අල්ලගන්නවා, එක්කෝ ඇමතිවරයාත් එක්ක හැප්පෙනවා. මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ගොඩක් ඇමතිවරු යටත් වෙනවා. ටිකක් ඇමතිවරු හැප්පෙනවා. තමුන්නාන්සේ යටත් වෙන්නෙත් නැහැ, හැප්පෙන්නෙත් නැහැ, හරියට පතෝල වාගෙයි. මම කියන්නේ, තමුන්නාන්සේ එහෙම තමයි. ඒ නිසා දැන් තීන්දුවක් ගන්න ඕනෑකම තිබෙනවා, මේ ගැන්සියෙන්, මේ කල්ලි පාලනයෙන් ක්‍රිකට් ආයතනය මුදාගන්න. එහෙම නම්, ඉස්සර වෙලාම ක්‍රීඩා පනත සංශෝධනය කරන්න. දැන් මේ සභාවෙන් යෝජනාවක් ආවා ආංශික අධීක්ෂණ කාරක සභාවල අදහස් ගන්න කියලා. තමුන්නාන්සේ මුලින්ම පනත් කෙටුම්පත හදලා ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අදහස් ගන්න. එහෙම නැතිව අදහස් අරගෙන පනත් කෙටුම්පත් හදන්න යනවා කියන්නේ ගරු ඇමතිතුමනි, ඒක වෙන්නේ නැති වැඩක්. ඕනෑ නම්, ඔබතුමාට හැම දාම මේක කල් දමන්න පුළුවන්, මම පනත් කෙටුම්පතක් හදමින් ඉන්නවා කියලා. ඔය තනතුර අවසන් වෙනකල් එහෙම කියන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මම කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

තමුන්නාන්සේ ඉස්සෙල්ලාම ක්‍රීඩා පනත සංශෝධනය කරන්න. ඊළඟට, ක්‍රිකට් ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගෙනෙන්න. අපි ඒක අනුමත කරමු. ICC එකට ලියන්න. ICC එක අපිව මරාගෙන කන්න එන දඩ බල්ලෙක් නොවෙයි. ඒ ගොල්ලනුත් අපේක්ෂා කරන්නේ රටක ක්‍රිකට් ක්‍රීඩාව මෙහෙයවන ආයතනය ස්වාධීනව පාලනය වීමයි. ඒක තමයි ඔවුන්ගේ අපේක්ෂාව. ICC එකට තිබුණේ නරක අත් දැකීම්.

[ගරු අනුර දිසානායක මහතා]

ආණ්ඩු මැදිහත් වෙලා මෙවා විනාශ කළා. ඒ නිසා තමයි ඔවුන් ස්වාධීනත්වය අපේක්ෂා කළේ. ඒ නිසා දැන් අපට චිත්‍රයක් මවනවා, ICC එක දඩ බල්ලෙක් කියලා. අපට ICC එකත් එක්ක තීන්දු ගන්න පුළුවන්. දකුණු අප්‍රිකාව දැනුත් එහෙම තීන්දු අරගෙන තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාවරයා ව්‍යවස්ථාව හදලා දැනුම් දුන්නා අපි ව්‍යවස්ථාවක් හැදුවා කියලා. 2015දී සිදත් වෙත්තමුණි අතුරු පාලක මණ්ඩලයේ සභාපතිවරයා හැටියට පත් කළා. මට මතකයි, එතුමාගේ කාලයේදී රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා ICC එකත් එක්ක කථා කරලා, අවශ්‍ය දේවල් සකස් කරන්න අපට අවස්ථාවක් දෙන්න කිව්වා. ඉතින්, ඒක අපි කළා නේ. ඒ නිසා තවදුරටත් මේක කල් අරින්න බැහැ. දැන් වාර්තාවක් ඇවිල්ලා තිබෙනවා. ඒකේ ඉතාම සාධනීය යෝජනා තිබෙනවා. තමුන්නාන්සේ අමාත්‍යාවරයා හැටියට ඒ වාර්තාව මුළුමනින් පිළිගන්න අවශ්‍ය නැහැ. ඔබතුමාගේ කාර්ය මණ්ඩලයෙනුත් අදහස් අරගෙන, ක්‍රීඩා පනතත්, ක්‍රිකට් ව්‍යවස්ථාවත් වෙනස් කරන්න ඕනෑ. කල්ලියක් අතේ, මාෆියාවක් අතේ තිබෙන ක්‍රිකට් ආයතනය මුදාගන්න ඕනෑ. ඇත පාසල්වල ඉතා දක්ෂ දරුවෝ ඉන්නවා. ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටිලා තිබෙනවා. මේ රටට විශාල ජයග්‍රහණ ගෙනපු ක්‍රීඩාව කඩා වැටිලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩකයන් පිළිබඳව විශාල අපකීර්තිමත් චිත්‍ර හැදිලා තිබෙනවා. ක්‍රීඩකයෝ ගැන ලියන ඒවා, කියන ඒවා දකිනකොට ඔවුන් ක්‍රිකට් ගහයිද? ඒකට මේ පාලක මණ්ඩලය වග කියන්න ඕනෑ. මෙවැනි වගකීමක් දරන වැඩිහිටි පිරිසක්, ආයතන දරන පිරිසක් මේ සල්ලිවලින් පෙන්වන්නේ මොකක්ද? සල්ලි විනාශය නොවෙයි.

ඒ සල්ලිවලින් පෙනෙන්නේ ඔවුනේ්ග වර්යාව, ඔවුන්ගේ හැදියාව. ඔවුන් සමාජයේ මොන තරම් පිරිහුණු පිරිසක්ද කියන එකයි මේ වාර්තාව තුළින් පෙන්වන්නේ. මේකෙන් පෙන්වන්නේ, ක්‍රීඩාංගණයක් හදනකොට කප්පම් ගැනීමක් නොවෙයි, ක්‍රිකට් බැට් එකක් ගේනකොට හොරකම් කිරීමක් නොවෙයි, තමන්ගේ පෞද්ගලික සුඛවිහරණය වෙනුවෙන් ක්‍රිකට් ආයතනයේ මුදල් වැය කර තිබෙන විධිය. ඒකෙන් පෙන්වන්නේ ඔවුන්ගේ ජීවිත මොන තරම් මජර ජීවිතද, මොන තරම් වගකීම් විරහිතව හැසිරෙන ජීවිතද කියන එකයි. ඔවුන්ට පුළුවන්ද, ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ විනය ගැන කථා කරන්න? ඔවුන්ට පුළුවන්ද, විනයානුකූල ක්‍රිකට් ක්‍රීඩාවක් හදන්න? ඔවුන්ට හදන්න බැහැ. කාලාන්තරයක් තිස්සේ අපේ ක්‍රිකට් ක්‍රීඩාව මාෆියා කල්ලි කිහිපයක් අතේ තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, එය බිඳීම සඳහායි තමුන්නාන්සේ නීති සම්පාදනය කරන්න ඕනෑ. ඒ සඳහා පාර්ලිමේන්තුවේ අපි අපේ සහයෝගය ලබා දෙන්න ලැහැස්තියි. බොහොම ස්තුතියි.

ගරු රොෂාන් රණසිංහ මහතා
(மாண்புமிகு ரொஷான் ரணசிங்க)
(The Hon. Roshan Ranasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක මැතිතුමාගේ කථාවෙන් පස්සේ මම හිතුවා කාරණා කිහිපයක් සම්බන්ධව මෙම සභාව සහ එතුමාව දැනුවත් කිරීම හොඳයි කියලා.

ගරු මන්ත්‍රීතුමනි, පළමුවැනි කාරණය මෙයයි. අපේ ක්‍රීඩා පනතට යටත්ව තමයි ඔලිම්පික් කමිටුව ස්ථාපනය කරලා තිබෙන්නේ. ඔලිම්පික් කමිටුව ජාත්‍යන්තරයට යනවා නම් ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කරන්න ඕනෑ. හැබැයි, ඒ අය පනතට අනුව නොවෙයි වැඩ කරන්නේ. පසුගිය දිනවල ශ්‍රී ලංකා රග්බි සංගමයේ සභාපතිවරයා සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන විනිශ්චය සභාව ලබා දුන් තීන්දුව අනුව ඔහුව ඉවත් කළා. ඒ ඉවත් කිරීම පිළිගත්තේ නැති නැන රග්බි සංගමය විසුරුවා හැරියා. හැබැයි, ඒකත් ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුවට යනවා දේශපාලන බලපෑමක් කළ විධියට. ඒක පදනම් කරගෙන ශ්‍රී ලංකා රග්බි සංගමයේ සාමාජිකත්වය තහනම් කරනවා, ජාත්‍යන්තර රග්බි සම්මේලනය. හැබැයි, ජාත්‍යන්තර රග්බි සම්මේලනයේ අය ලංකාවට ඇවිල්ලා අපි එක්ක සාකච්ඡා කළා. එතකොට ඔවුනේ්ග් නිර්දේශය වුණේත් රිස්ලි ඉල්ලියාස්, සභාපති ධුරයෙන් ඉවත් විය යුතුයි කියන එකමයි. එකම තීන්දුව. හැබැයි, ක්‍රීඩකයෝ දැන් මාස 5ක් තිස්සේ දුක් විඳිනවා. මේකට හේතුව තමයි, ඇතැම් සංගම්වල අය හැම දුෂණයක්ම කරලා දේශපාලන බලපෑමක් කළාය කියන කාරණය ජාත්‍යන්තරයට යැවීම.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාම මට චෝදනා කරනවා මම පතෝල වගේ කටයුතු කරනවා කියලා. ගරු මන්ත්‍රීතුමනි, මෙච්චර නිදහසක් ලබා දීලාත් ඒ අය කටයුතු කරන්නේ එහෙම නම්, මේකට මැදිහත් වෙන්න ඕනෑ කොහොමද කියලා මට තේරෙන්නේ නැහැ. විශේෂයෙන්ම මේ සඳහා ලබා දෙන සහයෝගය වැදගත්. ඒ සහයෝගයත් එක්ක අදාළ සංගම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, මම ඇමතිවරයා විධියට වැඩ භාර ගත්තාට පස්සේ පාපන්දු සම්මේලනයේ අය අධිකරණයට ගිහිල්ලා එකඟ වුණා, අවුරුදු 4ක කාල සීමාවක් ඇති කියලා. ඒ වාගේම වත්කම් හා බැරකම් ප්‍රකාශය ලබා දෙන්න ඕනෑ කියපු එකට එකඟ වුණා. වෙනත් සංගම්වල නියෝජනය කරන්න බැහැ, එක සංගමයක පමණයි ඉන්න ඕනෑ. නඩු දමපු අයම තමයි ගිහිල්ලා ඒවාට එකඟ වුණේ. ක්‍රිකට් ආයතනයත් ඒ විධියටම එකඟ වුණා. ඒ නිසා බොහොම උපායශීලි විධියට මේ ටිකේ ජයග්‍රහණ රැසක් ක්‍රීඩාවට ලබා දෙන්න අපට හැකියාව ලැබුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.25]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හේෂා විතානගේ මන්ත්‍රීතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විගණන වාර්තාවක් පදනම් කරගෙන. මේ ගරු සභාවේ කථා කරපු මන්ත්‍රීවරු ගණනාවකගේ අදහස් මම අහගෙන හිටියා. ඒ වාගේම ගරු ඇමතිතුමාගේ අදහස් දැක්වීමත් මම අහගෙන හිටියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2012 ඉඳලා 2015 වෙනතුරු මම ක්‍රීඩා හා යෞවන කටයුතු ඇමතිවරයා හැටියට කටයුතු කළා. ගරු ඇමතිතුමනි, ඒ කාලයේ මම ලබපු අත්දැකීම් කිහිපයක් ඔබතුමාගේ අවධානය පිණිස මම මතක් කරන්න කැමැතියි. මගේ අත්දැකීම් අනුවත් මේ සියලුම ක්‍රීඩා සංගම් අවංකයි කියලා මම කියන්නේ නැහැ. ඒගොල්ලෝ ක්‍රීඩා සංගම්වලට එන්න තිබෙන උනන්දුව, ක්‍රීඩාව ව්‍යාප්ත කරන්න දක්වනවා කියලා මම කියන්නේත් නැහැ. ඒ අතරේ ක්‍රීඩාවට ආදරය කරන, තමන්ගේ අතින් වියදම් කරගෙන ක්‍රීඩාව ජාත්‍යන්තරයට ගෙනයන්න විශාල මහන්සියක් ගන්න පිරිසකුත් ක්‍රීඩා සංගම්වල ඉන්නවා. ඒ නිසා අපි ක්‍රීඩා සංගම් එක්ක කටයුතු කරද්දී බොහොම පරිස්සම් වෙන්න ඕනෑ, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි. මම ක්‍රීඩා ඇමතිවරයා හැටියට කටයුතු කළ කාලයේ මේ රටේ ප්‍රබලම ක්‍රීඩා සංගම් තුනක සභාපතිවරුන්ට නාම යෝජනා දුන්නේ නැහැ.